36

## මුහුණු පොතේ බලපෑම නිසා සිදු වන භාෂා ගතිකත්වය පිළිබඳ විමසීමක්

*සෙව්වන්දි මනෝරත්න, ඒ.*[1]

මනුෂ්‍ය භාෂාව යනු හැඟීම්, අදහස් හා අභිලාෂයන් තවත් පුද්ගලයෙකුට සන්නිවේදනය කිරීම සඳහා මිනිසා විසින් ම නිෂ්පාදනය කර ගන්නා ලද්දකි. එකිනෙකට වෙනස් සමාජ සංස්කෘතිවලට අනුකූල ව හැඩ ගැසුණු භාෂාව සමාජ සම්මතයකි. භාෂාවේ ප්‍රධාන ලක්ෂණයක් ලෙස ගතිකත්වය දැක්විය හැකි ය. භාෂාවේ ගතිකත්වය කෙරෙහි බලපාන සාධක බොහොමයක් දක්නට ලැබේ. එයින් එක් නවතම සාධකයක් ලෙස මුහුණු පොත (Facebook) දැක්විය හැකි ද යනුවෙන් මතු වූ සංශය නිසා මුහුණු පොත, අද්‍යතන සිංහල භාෂාවේ ගතිකත්වය කෙරෙහි බලපාන්නේ කෙසේ ද යන්න විමසීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණයි. දිනෙන් දින මුහුණු පොත මගින් හාස්‍යය, උපහාසය, අපහාසය, දැනුම හා ධර්ම කරුණු ඇතුළත් පළ කිරීම් (Posts) ද විවිධ සමාජ සංසිද්ධීන් ද අන්තර්ජාලයට එකතු වෙයි. එහි දී දෛනික ව වාර්තා කරනු ලබන විවිධාකාර වූ සිද්ධීන් සමාජගත වීමෙන් භාෂාවේ ගතිකත්වය සිදු වන ආකාරය පිළිබඳ ව විමසීමට මුහුණු පොත භාවිත කරන මෙන් ම භාවිත නොකරන පුද්ගල නියැදි කෙරෙහි ද සමාජ හා වාග්විද්‍යා ලිඛිත මූලාශ්‍රයයන් කෙරෙහි ද මෙහි දී විශේෂ අවධානයක් යොමු වෙයි. ඒ අනුව මුහුණු පොතේ පළවන ඇතැම් සිද්ධිවල දී එම සිදුවීම්වලට සම්බන්ධ පුද්ගලයන් විසින් පවසනු ලබන ඇතැම් වදන් (නිදඃ අදාළ නෑනේ, ඔබට සතුටුයි ද දැන්...) මුහුණු පොතේ ඇතැම් පිටුවල පාලකවරුන් (Page Admin) ප්‍රකෘති ස්වරූපයෙන් හෝ විකෘති ස්වරූපයෙන් පළකරනු ලැබීම හේතුවෙන් හා නිරන්තර භාවිතය හේතුවෙන් එය සමාජ සම්මතයක් බවට පත්වීමෙන් අද්‍යතන භාෂණ සමාජයේ දී ද එම ප්‍රකාශයන් උපයෝගී කර ගනිමින් පුද්ගල සංවාද සිදු වන අයුරු දකින්නට ලැබෙන අතර මුහුණු පොතෙහි පළ වන ඇතැම් සිදුවීම් අද්‍යතන සිංහල භාෂණ සමාජය කෙරෙහි බලපෑම් කරන බව ඒ ඇසුරින් නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පදඃ භාෂාව, ගතිකත්වය, මුහුණු පොත, සමාජ සංසිද්ධීන්, අන්තර්ජාලය

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, සිංහල අධ්‍යයනාංශය*